Annex III


උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
උසස් අධ්‍යාපන අංශය
உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சு
உயர் கல்விப் பிரிவு
MINISTRY OF HIGHER EDUCATION & HIGHWAYS
HIGHER EDUCATION DIVISION


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | HE/AD/VP/2016 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2016.08.16 |

මහෝපාධ්‍යායයන් වහන්සේ
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

මහෝපාධ්‍යායයන් වහන්සේ
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

<u>**සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාදීමේ යෝජනා ක්‍රමය**</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක TIP/SS/01/03 හා 2016.07.14 දිනැති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ 01/2016 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි. එහි පිටපතක් පහසු අවධානය සඳහා මේ සමඟ අමුණා ඇත.

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, රාජ්‍ය විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන ආයතනයන්හි ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් විධායක තනතුරක වසර අටක (08) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්ටද, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය යටතේ සේවය කරනු ලබන වසර දොළහක (12) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් විධායක නිලධාරීන්ටද, විශ්වවිද්‍යාල කුලපතිවරුන් සඳහාද එම චක්‍රලේඛයේ සඳහන් කොන්දේසි, නියමයන් හා සහන වලට යටත්ව සහනදායි පදනම මත මෝටර් රථ ආනයනය කිරීම සහ දේශීයව නිෂ්පාදනය කරන ලද මෝටර් රථ මිලදී ගැනීම සඳහා බලපත්‍ර ලබාගැනීමට හිමිකම ඇත.

03. ඒ අනුව විශ්වවිද්‍යාල පද්ධතියට අදාල අයදුම්පත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ, බෞද්ධ විශ්වවිද්‍යාල දෙකෙහි නිලධාරීන්ගේ අදාල අයදුම්පත් එම විශ්වවිද්‍යාලවල මහෝපාධ්‍යායයන් වහන්සේලාගේ, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අයත් අයදුම්පත් එහි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ <u>පෞද්ගලික නිර්දේශය සහිතව</u> පහත දක්වා ඇති අවශ්‍යතායන්ද, පිරික්සුම් ලේඛණයද (ඇමුණුම අ) අදාල ඇමුණුම්ද සමඟ කොළඹ 07, වෝඩ් පෙදෙස, අංක 18 දරණ ස්ථානයේ පිහිටි උසස් අධ්‍යාපන අංශය වෙත යොමු කළ යුතුය.

- චක්‍රලේඛයෙහි ඇමුණුම III හි සඳහන් සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාගැනීම සඳහා වන අයදුම් පත්‍රයෙහි "ඊ" කොටස සම්පූර්ණ කිරීමේදී අදාල අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනු භාර නිලධාරීන් විසින් පෞද්ගලිකව පරීක්ෂා කර බලා අයදුම්පතෙහි සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බවට පෞද්ගලිකව සහතික කළ යුතු අතර, එසේ සහතික කරනු ලබන නිලධාරීන්ගේ අත්සනට යටින් එම නිලධාරියාගේ නම, තනතුර සහ ජාතික හැඳුනුම්පත් අංකය පැහැදිලිව සටහන් කළ යුතුය.

- අදාල නිලධාරීන් පළමු වරට බලපත්‍රය ඉල්ලුම් කිරීමේදී ඔහුගේ/ඇයගේ පත්වීම් ලිපියේ, වැඩ භාරගත් ලිපියේ හා සේවය ස්ථිර කිරීමේ ලිපියේ සහතික කරන ලද පිටපත් සහ දෙවන වරට බලපත්‍රය සඳහා ඉල්ලුම් කිරීමේදී පලමුවරට බදු සහන යටතේ ලබාගත් මෝටර් රථය ලියාපදිංචි කළ සහතිකය හෝ එහි සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

- වෙනත් අමාත්‍යාංශයකින් නිදහස් වී විශ්වවිද්‍යාල සේවයට හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට පැමිණි නිලධාරීන් සම්බන්ධයෙන් එසේ නිදහස් කිරීමට එකඟතාවය ලබාගත් ලිපිය, පෙර දැරූ තනතුරට අදාල විස්තර වාර්තාව සහ නව තනතුරට අදාල පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

- මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනය වන විට කුමන හෝ සහනදායි මෝටර් රථ බලපත්‍ර යෝජනා ක්‍රමයක් යටතේ දෙවරකදී හෝ ඊට වැඩි වාර ගණනකදී වාහන ලබාගෙන නොමැති බවට හෝ මීට පෙර මෝටර් රථයක් ලබාගෙන ඇත්නම් එය ලියාපදිංචි කළ දින සිට වසර දහයක් (10) ක් ඉක්මවා ඇති බවට අදාල අයදුම්කරු විසින් ගෞරව බහුමාන සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

- මේ සමග අමුණා ඇති (ඇමුණුම අ) පිරික්සුම් ලේඛණය (check list) නිසි පරිදි සම්පූර්ණ කර අයදුම්පත්‍රය සමග එවිය යුතුය.

- මෙම යෝජනා ක්‍රමය යටතේ බලපත්‍රයක් ලබාගැනීමට සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් පමණක් මෙම චක්‍රලේඛයේ "ඇමුණුම III" යටතේ අයදුම්පත්‍රය මගින් ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු වේ. (පරිගණක ගත කිරීමේ පහසුව සඳහා ඉල්ලුම්පත් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් සම්පූර්ණ කළ යුතු වේ) අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රයන්හි ප්‍රකාශිත තොරතුරු නීත්‍යානුකූල ප්‍රකාශ ලෙස සලකනු ලැබේ. එබැවින් අපැහැදිලි අයුරින් තොරතුරු සැපයීම, අයදුම්පත්‍රයේ සම්පූර්ණ කළ යුතු කොටස් මඟ හැරීම සහ සාවද්‍ය තොරතුරු සැපයීම මත බලපත්‍රය ප්‍රමාද වීමක්, අහිමිවීමක්, අවලංගු කිරීමක් වූ විට ඒ පිළිබඳව සම්පූර්ණ වගකීම බලපත්‍ර අයදුම්කරු විසින් දැරිය යුතුය.

04. යම් හෙයකින් අදාල නිලධාරීන් විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරමින් සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍රයක් ලබාගෙන වාහනයක් ආනයනය කර ඇති බවට ඔප්පු වුව හොත් එම බලපත්‍රය අවලංගු කිරීමට සිදුවීමෙන් රජයට අයවිය යුතු සියළුම ගාස්තු එම අයදුම්කරුවන් විසින් පෞද්ගලිකවම දැරිය යුතුය.

05. ඉහත උපදෙස් ඔබ ආයතනයෙහි සහ ඒ යටතේ ඇති සියළුම ආයතනයන්හි අදාල නිලධාරීන් වෙත දැන්වීමටත්, ඒ අනුව ඉදිරි කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

පී.ජී.ජයසිංහ
අතිරේක ලේකම් (පාලන හා මුදල්)

අත්:කලේ/ ඩී.සී.දිසානායක
ලේකම්
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය

ඇමුණුම "අ"

<u>සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාදීමේ යෝජනා ක්‍රමය</u>

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 යටතේ සහනදායී පදනම මත මෝටර් රථ

ආනයනය කිරීම සහ බලපත්‍ර ලබාගැනීම සඳහා සපුරාලිය යුතු පිරික්සුම් ලේඛනය,

අයදුම්පත් අංකය හා දිනය :-

අයදුම්කරුගේ නම :-

සභාව/ විශ්වවිද්‍යාලය / ආයතනය :-

තනතුර :-

ඔව්/ඇත/නැත/අදාල නොවේ

01. අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර ඇති බව ......................

02. අයදුම්පතෙහි ඉල්ලුම් කරන නිළධාරියාගේ අත්සන හා දිනය නිවැරදිව සටහන් කර ඇති බව ......................

03. අයදුම්පතෙහි "ඊ" කොටස නිවැරදිව සම්පූර්ණ කොට ආයතන ප්‍රධානීගේ අත්සන, නිල මුද්‍රාව හා දිනය නිවැරදිව සටහන් කර ඇති බව ......................

04. මීට පෙර බදු සහන යටතේ මෝටර් රථයක් ලබාගෙන ඇත්නම් එහි ලියාපදිංචි කළ සහතිකය ......................

05. ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු බව ......................

06. ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විධායක ශ්‍රේණියේ නිලධාරියෙකු බව ......................

07. තනතුරට අදාළ වැටුප් කේතය සඳහන් කර තිබීම ......................

08. පත්වීම් ලිපියේ සහ සේවය ස්ථිර කිරීමේ ලිපියේ සහතික කළ පිටපත අමුණා ඇති බව ......................

09. ජාතික හැඳුනුම්පතේ පිටපත අමුණා ඇති බව ......................

10. මහෝපාධ්‍යායයන් වහන්සේ /ආයතන ප්‍රධානී/ උපකුලපති/විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ නිර්දේශය ......................

11. අස්ථානගතවූ බලපත්‍රයක් වෙනුවට නව බලපත්‍රයක් ලබාගැනීමේදී, පොලිස් පැමිණිල්ලේ පිටපත සහ බලපත්‍රය අහෝසි කිරීමේ ලිපියේ පිටපත ......................

12. වෙනත් අමාත්‍යාංශයකින් නිදහස් වී විශ්වවිද්‍යාල සේවයට/ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට ඇතුලත් වූයේ නම් එම නිදහස් කිරීමේ ලිපියේ පිටපත හා අදාළ පත්වීම් ලිපියේ පිටපත ......................

13. මේ වන විට සහනදායී මෝටර් රථ බලපත්‍ර යෝජනා ක්‍රමයක් යටතේ දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනකදී හෝ වාහන ලබා නොතිබීම පිළිබඳ අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති ගෞරව බහුමාන සහතිකය ......................

14. මෙයට පෙර කුමන හෝ සහනදායි මෝටර් රථ බලපත්‍ර යෝජනා ක්‍රමයක් යටතේ මෝටර් රථයක් ලබාගෙන ඇත්නම් එය ලියාපදිංචි කල දින සිට වසර 10ක් සම්පූර්ණ කර ඇති බවට අදාල අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති ගෞරව බහුමාන සහතිකය ......................

15. නියමිත පරිදි සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බව

16. වැටුප් රහිත නිවාඩු මත නිදහස් කර ඇති නිළධාරියෙකු නොවන බව. ......................

17. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබාගත් හෝ ඉවත් වූ පසුව සුදුසුකම් ලබන තනතුරක කොන්ත්‍රාත් පදනම මත පත්කර ඇති නිලධාරියෙකු නොවන බව. ......................

18. සුදුසුකම් ලබන තනතුරට පෞද්ගලික වන සේ හෝ අධිස්වක පදනම මත පත්කර නොමැති බව. ......................

19. මූලික විමර්ශනයක් හෝ විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කර දැනට එම ක්‍රියාමාර්ගය අවසන් කර නොමැති නිලධාරියෙකු නොවන බව ......................

20. සහනදායි පදනම මත මෝටර් රථ ආනයන බලපත්‍ර ලබා ගැනීමට සුදුසුකම් සහිත තනතුරු එකකට වැඩියෙන් නොදරණ බව. ......................

ඉහත නම් සඳහන් නිලධාරියා/ නිලධාරිනියගේ පෞද්ගලික ලිපි ගොනුව පරීක්ෂා කරන ලද අතර ඔහු /ඇය විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි.

......................................................     ......................................

ලේකම් / අධ්‍යක්ෂ / ලේඛකාධිකාරී     නිල මුද්‍රාව     දිනය

........................................................................ සභාව / විශ්වවිද්‍යාලය / ආයතනය